---

**විසර්ජන ශීර්ෂය - 269**

**මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**විගණකාධිපති වාර්තාව - 2012**

---

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

---

(i) දිළිඳුකම අඩුකිරීමට මුල් පිරීම හා බෙදාහැරීම් කළමනාකරණය

(ii) ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය

(iii) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා පාලනය

(iv) මැතිවරණ සම්බන්ධීකරණය

(v) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා මෙහෙයවීම

(vi) විශ්‍රාම වැටුප් ගෙවීම

(vii) උපත්, විවාහ හා මරණ ලියාපදිංචි කිරීම.

(viii) ජාතික හැඳුනුම්පත් හා ගමන් බලපත්‍ර ඉල්ලුම්පත් භාරගැනීම.

(ix) ඉඩම් සම්බන්ධ කටයුතු

(x) ආදායම එකතු කිරීම.

(xi) ජල ගැලීම් සහන කටයුතු

(xii) මානව සම්පත් සංවර්ධනය

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

---

(අ) කෝරලෙයි පත්තු උතුර

(ආ) කෝරලෙයි පත්තු බටහිර

(ඇ) කෝරලෙයි පත්තු මධ්‍යම

(ඈ) කෝරලෙයි පත්තු

(ඉ) කෝරලෙයි පත්තු දකුණ

(ඊ) එරාවුර්පත්තු

(උ) එරාවුර් ටවුන්

(ඌ) මන්මුනෙයි උතුර

(එ) කාත්තන්කුඩි

(ඒ) මන්මුනෙයි පත්තු

(ඔ) මන්මුනෙයි දකුණ හා එරුවිල් පත්ත

(ඕ) පොරතිවු පත්තු

(ක) මන්මුනෙයි නිරිත

(ග) මන්මුනෙයි බටහිර

**1.3 විගණන විෂය පථය**

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් පකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුලි 03 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව, මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.6 සිට 1.11 දක්වා ඡේද වල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ වලින් ඇති වන බලපෑම හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම්**

**(i) මූළු ප්‍රතිපාදනය හා වියදම**

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ ක්‍රියාත්මකවන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.462,255,066 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.432,947,429 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරි කිරීම් රු.29,307,637 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6.3 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 290,450,000 | 404,805,066 | 398,477,963 | 6,327,103 | 1.6 |
| මූලධන | 32,450,000 | 57,450,000 | 34,469,466 | 22,980,534 | 40 |
| එකතුව | 322,900,000 | 462,255,066 | 432,947,429 | 29,307,637 | |

(ii) **පැහැදිලි නොකළ වෙනස්කම්**

විසර්ජන ගිණුමේ දැක්වෙන පාඩු හා විගණනයට ඉදිරිපත් කරන ලද පාඩු පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය අතර රු.1,105,352 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 21 කින් හා දෙපාර්තමේන්තු 17 කින් පිළිවෙලින් රු.1,021,038,129 කින් හා රු.1,742,681,949 කින් සමන්විත එකතුව රු.2,763,720,078 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, එයින් පිළිවෙලින් රු.951,925,349 කින් හා රු.1,730,783,674 කින් සමන්විත එකතුව රු.2,682,709,023 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.81,011,055 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ආ) **ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ආදායම් සංකේත 16 ක් සඳහා 2012 වර්ෂය තුළදී රු.මිලියන 65.92 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර රු.මිලියන 68.68 ක ආදායමක් රැස්කර ගෙන තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමින් සියයට 0.56 සිට සියයට 3139 ක ආදායමක් රැස්කර ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම් රැස්කිරීම | ( අඩුවෙන් රැස්කිරීම) / වැඩියෙන් රැස්කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 10-03-07-02 | 5,490 | 5,490 | 0 | 100 |
| 10-03-07-03 | 9,549 | 9,550 | 0 | 100 |
| 10-03-07-05 | 11,500 | 10,250 | (1,250) | 89 |
| 10-03-07-99 | 860,000 | 1,037,486 | 177,485 | 121 |
| 20-02-01-01 | 1,750,000 | 1,550,685 | (199,315) | 89 |
| 20-02-02-99 | 3,720,000 | 3,158,060 | (561,940) | 85 |
| 20-03-01-00 | 65,000 | 137,855 | 72,855 | 212 |
| 20-02-01-03 | 32,000 | 32,000 | 0 | 100 |
| 20-03-02-07 | 6,965,900 | 6,965,900 | 0 | 100 |
| 20-03-02-09 | 400 | 400 | 0 | 100 |
| 20-03-02-13 | 3,388,475 | 3,388,475 | 0 | 100 |
| 20-03-02-14 | 35,274,830 | 35,274,830 | 0 | 100 |
| 20-03-02-99 | 93,730 | 93,730 | 0 | 100 |
| 20-03-99-00 | 165,000 | 5,180,364 | 5,015,364 | 3,139 |
| 20-04-01-00 | 11,830,002 | 11,830,003 | 0 | 100 |
| 20-06-02-00 | 1,750,000 | 9,725 | (1,740,275) | 0.56 |
| එකතුව | 65,921,876 | 68,684,803 | | |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**පාර්ලිමේන්තුව විසින් බලය දෙන ලද සීමා**

අංක 269011 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් බලය දෙන ලද සීමා හා තථ්‍ය වටිනාකම් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 36,500,000 | 28,101,337 | 20,000,000 | 33,782,187 | 87,000,000 | 78,967,907 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව, 2012 දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,729,627 ක් වූ ශේෂ හිඟ හිට පැවැති අතර එම ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

(ii) මඩකලපුව , දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට පළාත් සභාවට මාරු කරන ලද නිලධාරීන් 26 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට 07 දක්වා කාලයක් හිඟ හිට පැවති රු.2,253,676 ක් වූ ණය ශේෂ 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකර පැවතුණි.

(ඇ) **පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය එකතුව රු.106,351,526 ක් වූ අතර , ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6003/0/0/045/0 | 105,787,688 |
| 6003/0/0/015/0 | 563,838 |
| | 106,351,526 |

(i) 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් ප්‍රකාරව පොදු තැන්පතු ගිණුමේ ශේෂය රු.563,838 ක් ලෙස දැක්වෙන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ ශේෂය ශුන්‍ය ලෙස දැක්වුණි. 1983 වර්ෂයට පෙර වංචාවක් හේතුවෙන් දරන ලද පාඩුවක් මෙම වෙනසට හේතුව ලෙස වාර්තා කර තිබුණද වර්ෂ 28 කට වැඩි කාලයක් වූ එම වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ස්වයං රැකියා සහන ගෙවීම් සඳහා 2011 මාර්තු 16 දින නැගෙනහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් රු.40,000 ක මුදලක් ලැබී තිබුණි. කෙසේ වුවද මෙම මුදල අදාළ ප්‍රතිලාභීන්ට ගෙවා නොතිබුණු අතර, කාන්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් විසින් වර්ෂ දෙකකට ආසන්න කාලයක් තැන්පතු ගිණුමේ තබා තිබුණි.

## 1.6 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

**සංයුක්ත සැලැස්ම**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට යොමු කරන ලද රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ් /ආර්/2/2/3/5(4) දරන ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට අවම වශයෙන් ඉදිරි වර්ෂ 3 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දක්වා එම සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත විශ්ලේෂණය කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක සංඛ්‍යාව | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 06 | මාස 09 ක් |
| (ii). | මෝටර් වාහන | 04 | වර්ෂ 03 ට වැඩි |
| (iii). | ඡායා පිටපත් යන්ත්‍ර | 04 | වර්ෂ 01 ට වැඩි |
| (iv). | වෙනත් වත්කම් | 32 | වර්ෂ 03 ට වැඩි |

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/ සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුල්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2011 සහ 2012 වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

1.8 **අනුකූල නොවීම්**

**නීති , රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති , රීති හා රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i). මුදල් රෙගුලාසි** | | |
| මු.රෙ. 109 | 10,556,370 | එකතුව රු.9,033,110 ක් හා රු.1,523,260 ක් වු පාඩු පිළිවෙලින් වර්ෂ 5 කට හා වර්ෂ 10 කට වැඩි කාලයක් පරිශේෂව පැවතුණ අතර මෙම ශේෂ අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ. 138 | 217,550 | කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වවුචර් සහතික කිරීමේ නිලධාරී විසින් එකතුව රු.217,550 ක් වු ගෙවීම් වවුචර් හතරක් සහතික කර නොතිබුණි. |
| මු.රෙ. 571 | 973,364 | වර්ෂ 2 කට වැඩි කාලයක් පැවති රු.973,364 ක් වු රඳවා ගැනීම් මුදල් ශේෂ දෙකක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| **(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |

| | | |
|---|---|---|
| 2006 මාර්තු 21 දින හා 2009 ජුන 12 දිනැති අංක එච්එ / ඩීඒ / 12/27 දරන චක්‍රලේඛය | 104,357,414 | 2007 සිට 2011 වර්ෂ තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා රජයේ නිල නිවාස 14 ක් ඉදිකර තිබුණද, නිල නිවාස 11 ක අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් පදිංචිවී නොතිබුණි. |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන නියැදි පරීක්ෂණයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

### (අ) මී මැසි පාලන ව්‍යාපෘතිය

සමාලෝචිත වර්ෂය තුළ දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක මී මැසි පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී රු.511,560 ක මුදලක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 261 ක් සඳහා මී මැසි පෙට්ටි සපයා තිබුණද, ප්‍රතිලාභීන් 11 දෙනෙකු පමණක් ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කර තිබුණි.

### (ආ) හතු වගාකිරීමේ ව්‍යාපෘතිය

සමාලෝචිත වර්ෂය තුළ දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක හතු වගා කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී රු.921,200 ක මුදලක් දරා තිබුණි. කෙසේ වුවද වෙළඳපොළ අවස්ථාවන් නොමැවීම හේතුවෙන් ප්‍රතිලාභීන් 94 දෙනෙකුගෙන් ප්‍රතිලාභීන් 88 ක් එම කාර්යයන් අත්හැර දමා තිබුණි.

## 1.10 අභ්‍යන්තර පාලනය

### මුදල් පාලනයේ දුර්වලතා

රු.294,605 ක් වූ ගෙවීම් වවුචර් දෙකක් අනුමත කර, සහතික කර හා සටහන් කර 2012 දෙසැම්බර් 31 දින වැය ලෙජරයේද සටහන් කර තිබූ අතර මුදල් පොතේ මෙන්ම අදාළ වවුචර්වලද චෙක්පත් අංකයද සටහන් කර තිබුණි. එහෙත් 2013 මාර්තු 04 වන විටත් කාන්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම ගෙවීම් වලට අදාළව චෙක්පත් ලියා නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

---

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - |
| (ii). | තෘතියික මට්ටම | 62 | 52 | 10 |
| (iii). | ද්විතියික මට්ටම | 718 | 588 | 130 |
| (iv). | ප්‍රාථමික මට්ටම | 146 | 123 | 23 |
| (v). | අනියම්/ තාවකාලික | 18 | 16 | 2 |
| | එකතුව | 945 | 780 | 165 |